# නිර්මාණ Nirmana

## නව වසර !

දින සති මාස ගෙවිලා කාලය ඔස්සේ
වස රක් ගෙවී ඇත දුක සැප හැම අස්සේ
සුන් වූ පැතුම් යළි පණ ගන්වනු රිස්සේ
නව අවුරුදු සුවඳින් හදවත ගැස්සේ

ලැබූ අවුරුද්ද ගත වී ගිය විලාසෙට
පැමිණිය දුක් ගැහැට වල තිබූ කරුවලට
ඔද්දල් වුනු සිත හද පිරී මදින්නට
එන අවුරුද්ද සරණක් ලෙස සිතීමට


ජීවිත ඔරුව පා වෙන විට සංසාරේ
දුක සැප දෙකම එක විදිහට ඇති ආරේ
මැනවින් වැටහුණත් ගත වූ හැම වසරේ
නව අවුරුද්ද මත සුභ පැතුමන් විසිරේ

නොලැබුන සතුට නව වසරේ ලබන් නට
මල්දම් දමා ජය හඬ මැද පුදන් නට
දොහොත් නගා හද සතුටින් පිළි ගන්ට
දහසක් සිහින මවමින් නව වසර කට

වසරක් ගෙවී වසරක් ආවත් නැවත
එම වසරත් ගෙවී යනවා යන පුවත
මැනවින් දන හැඳින සකසා තමන් හිත
නව අවුරුද්ද පිළිගැනුමයි කළ යුත්ත

♦ මධූරි අබේවික්‍රම
Harrow UK

## ඇය ඔහුට ලියූ කවි - 4
## *Poetry she wrote to him*



සුළඟක් වගේ ඇවිදින් දුර සිට ම වෙත
සුසුමක් තබා ප්‍රිය තෙපුලින් දෙතොල් මත
රොන් සුණු සුවඳ තවරා රත් කොපුල් මත
අඳුනක් තබා යනවද හද පත්ල මත

කුන්ද සමන් පෙති නහවයි සඳ වතුර
කවි සිත ගොළුයි ගෙතුණේ නෑ පද හතර
විකසිත වුණේ ඔබ වෙනුවෙනි විමන් දොර
සුවඳක් තබා යනවද නුඹ දුරින් දුර

දෙනෝ දහක් දෙන සිටියත් සතර අත
පාළුයි මගේ හද පාළුයි බැලූ අත
අඳුරක් ගලා බොඳවෙනවා මගේ නෙත
කියාගන්න බැරි ලෙස හඬ නවා සිත

මල් දහසක් පිපිලා තිබුණේ රුවට
ඉන් එක මලකි දුටුවේ සකි නෙලන් නට
එනමුදු නොහැක ඒ වෙත පිය නගන් නට
වාවනු කෙලෙස දැනෙනා දුක අනේ මට

සුපෙම් සුවඳ හද විනිවිද මට දැනුණේ
මේ ගී පොකුරු නොනිමෙන සෙනෙහස නමිනේ
මගේ පෙමට නොදෙවෙනි පින්බර ළඳුනේ
නුඹෙ හිමිසඳට පෙම්බැඳි මට කමනු මැනේ!

(අඥාතයි) Anon - x x x

## අපි නෑදෑයෝ

ලාන්සරේ ඉගිලෙනවා
අහක බලාගෙන යනවා
පොඩි අයියගෙ
ලොකු කොළුවා
ආඩම්බර පෙන්නනවා

ලාන්සරේ නවතිනවා
අපවත් දාගෙන යනවා
ලොකු අයියගෙ
පොඩි කොළුවත්
ආඩම්බර පෙන්නනවා

♦ සනත් පියසේන
මඩපාත Sri Lanka

## වඳිමු වඳිමු සිරිපාදේ !

සු වි සෙ ස් පරිසරයම මන නන් දයි
නිකෙලෙස් බර අය මළුවට කැන් දයි
ජ න හි ස් බුදුසිරි පතුලස රන් දයි
බු දු රැ ස් විහිදෙන සමනළ කන් දයි

නයන පිනන මන පිනවන දෙරණයි
ප ව න හැපෙන සුලලිත වන අරණයි
නගින බහින හැමටම බුදු සරණයි
සුමන සමන් දෙවිඳුගෙ රැක වරණයි

ස සු නම්බරයට අරුණළු පින් බර
මු සු කරමින් බිඳලන මිහිදුම් තිර
දෙසු සදහම් ඇති තෙසරණ ගම් බිර
ද සු නකි හිරුසේවය අති සුන් දර

ඇ ත මළුව තුළ සැසි බුදුන් නේ
ගී ත නදින් ගංටාරෙ වදින් නේ
දෝත හිසට ගෙන පැගෙන පින් නේ
සී ත ගඟුලෙ බැස නාගෙන යන් නේ

සා දු සාදු හඬ සිපගෙන කඳු ගැට
මෝදු වෙමින් ආපසු විත් බුදු ගෙට
වී දු වමින් පින හදවත මුදු කොට
පැ දු නිවන් මඟ පෙන්වයි බොදු නට

අඩියෙන් අඩියට පඩුරු බැඳේ යා
පඩියෙන් පඩියට සාදු නදේ යා
ගුවනින් ගංටා නාදෙ ඇදේ යා
හද මන් දිර වල සුගුණ රැඳේ යා

කෙ ලෙ ස් නිවී දෙන මනසට සහ නය
දොළොස් මහේ ඇවිලෙන බුදු පහ නය
වෙ සෙ ස් බැතින් නමදින ජන ගහ නය
ම නු ස් ස කම් උපදින රජ දහ නය

සුදි ලෙන බුදු එළි මැද බැති නාදේ
ඇදි ඇදි මහගිරි දඹයට වීදේ
ඉ දි කටු පානෙදි ලද අව බෝදේ
ව දි මු වදිමු අපි බුදු සිරි පාදේ !

♦ කිවිපති පාතකඩ කුලතිලක
Maharagama Sri Lanka

## එකම හීනයක්

රන් වැටකින් වටවී ඇති පින් බිමේ
වියරු සැහැසැකම් දුරලා මිතුරනේ
එකම ධජය සෙවනැල්ලේ සැනසිල්ලේ
සැතපෙන්නට පාවඩ හෙළමුද දෙරණේ

හදවත යට ගිනිගන්නා පවිටු හැඟුම්
දෙපිළ බෙදී දෙපසට වී හඬන හැඬුම්
ලයෙහි හොවා දරු හැදුවේ එක ලෙස නම්
ලේ ගංගා සදා කුමට දෝ මායිම්

ගතෙහි රුහිරු එක ලෙස නම් දුවන්නේ
ජාතිය කෙලෙසක නම් වැට බඳින්නේ
මිනිසා මිනිසට කිම වෙඩි බිඳින්නේ
එකම හීනයක හිඳිනට වරෙන්නේ

බෙදා කඩා ඉපදුණු දේශය අපගේ
කුමකට දෙපිළක ඉඳ ගිනිදැල් අතරේ
වරද කිමැයි සිතුවොත් මිනිසුන් විළසේ
මව්බිම සාමයෙ සුවඳින් කිරි ඉතිරේ

♦ ධම්මි විජේසිංහ Canada

## LOST LOVE

Everyone says
Not to suffer….
Cause they don't know the love,
the protection, I got from you.
Even though I was seven
at that time…
I still can remember the whole life
filled with joy and love.

Your words taught me
the lessons of reality,
Your gentle touch
gave me comfort,

But….somebody took you away
from my life,
as you couldn't come back again.

Now I'm in my late twenties.
My children are having a father
to love and care.

But for me………until I die,
your love is the lost LOVE,
My dear father......!

♦ Jayani Champika
Jayawardana
*Sri Lanka*

## ගජමන් නෝනා

මාතර පුරවරේ වෙහෙරගම්පිට ඇගෙ උපන් ගමය
දෝන ඉසබෙලා පෙරුමල් කොරනේලිය ඇගේ නමය
උපතින් පෙර පිනෙන් ලැබුණු කවිකම ජීවිතේ සමය
ගජමන් නෝනා යනුවෙන් පටබැඳුණේ ගමේ කමය

සිතේ කැකෑරෙන සිතුවිලි එලෙසම කවියට ගේනා
ජනකවි ආරෙට යොමුවුණු පන්හිඳ පෙළහර පානා
උගතුන් මැද දස්කම් පා සලෙලුන් මගහැර දානා
රුහුණේ ජයකොඩි එසවූ කිවිඳිය ගජමන් නෝනා

වියතුන් ගුරු සිසුන් අතර මුල් තැන සිටි කවි කාරී
පස් කලණින් හෙබි සුන්දර කුලහන සියුමැලි නාරී
මව්පිය සෙවණේ වැඩුණත් මල්සර පහරින් බේරී
ගාර්දියස් ආරච්චිට වූවා පෙම්බර බාරී

විනෝදයෙන් ගෙවූ කාලය විගසින් අඳුරට ගියාට
වැන්දඹු වුණ මුත් දෙවරක් බරක් වුණේ නැත පියාට
මුදලි මුහන්දිරම් ඇත්තො පෙම්පත් ලිව්වත් එයාට
බහක් දුන්නෙ නැහැ කාටත් නෝනා ආවට ගියාට

දරුවන් සහ දෙමාපියන් සැමියන් මේ ලොව නැත්තේ
කන්නට ඉන්නට දෙන්නට කවුරුද පිහිටට ඇත්තේ
ජෝන් ඩොයිලි දිසාපතිට ලියලා ඇගෙ දුක චිත්තේ
තෑගි ලැබුණු ගම්වරයයි නෝනාගම නම ගත්තේ

රති සීපද සංවාදද පැසසුම් රචනා අතරේ
දෙනිපිටියේ නුගරුක වැනුමද තව දිග අග මැතිරේ
කවිකාරිය කටකාරිය දඟකාරිය නම් පැතිරේ
ගජමන් නෝනා පරසිඳු දිනූ රුහුණට කිරි ඉතිරේ

♦ රත්නා ලංකා අබේවික්‍රම
Sri Lanka





## දවුල

හත්වරිගයක්
හොයාගෙන කාපු
දවුල.
ලොකු එකා වික්කා
හාමුදුරුවනේ.
සල්ලිවලට?
හ්ම්!
ඌට දික් කලිසමක් මහන්ඩ
අනේ !
දානෙට
මරණෙට
පිරිතට පිංකමට
කෝකටත් තිබුණ
දවුල !

♦ කෝ. ආරියරතන
London

## මිතුරෝ

සිහිවෙයි මට නිබඳ
අතීත මිතුරන්
මා නොහැර විසූ
සිගරැට්ටුවෙන්
උගුරක් ඇද
නෙවිල් කියයි
මට දිගුකරමින්
ඉඳා මචන්,
මට ඇති,
මම යනවා,
හෙට හම්බවෙමු.
රණේ යමුද
සිරීපාදෙ?
හොයාගමු සල්ලි
කොහෙන් හරි.
හෙට රෑ නමයට
හැටන් කෝච්චිය.
දැන් ඒ සියල්ලෝ
නික්ම ගොසිනි
හිතවත්කම් සියල්ල
මා ළඟ
පරිස්සමට තබා.
හමුවුණු දිනක
ආපසු දෙමි
ඒ හිතවත්කම් සේරම
ඒ අයුරින්ම
එකක් නෑර.

♦ Daren
London NW3

## සෙනෙහස වෙස් ගෙන

සුසුදු සුමුදු පෙණ බුබුලක වෙස් ගෙන
සැඩ පහරක් විය දිවිය මුලා කළ
ගිමන නිවන මඳ පවනක වෙස් ගෙන
කුණාටුවක් විය දිවිය අවුල් කළ

සිනිඳු සුමට මල් පෙත්තක වෙස් ගෙන
විස කටුවක් විය නිබඳ රිදුම් දෙන
කුසලානෙක මී විතක වෙසක් ගෙන
විසකි හලා හල දිවිය ගිලන් කළ

පුළුන් රොදක බඳු සැහැල්ලු වෙස් ගෙන
මහා බරක් විය සිත යට සැඟවුණ
සීත සමේ උණුසුමක වෙසක් ගෙන
මහ ගින්නක් විය දිවිය දවා හළ

♦ මදුරි රත්නායක
Ilford Essex UK

## සැඟවුම.....

ඉකිගසා හඬන්නට සිතෙයි මට
ඒත් කඳුලක් නොනැගෙයි නෙතට
දෝරෙගිය කඳුළුගංගා සිඳී ඇති බැවින්
සුසුමක් හෙලන්නට සිතෙයි මට
ඒත් සුසුම් නොනැගෙයි හදට
සුළිසුළං වී සුසුමන් ගසාගෙන ඇතටම
ගිය බැවින්
හීයක වේගයෙන් පපුතුරට කිඳා බසිනා
ගිලින්නටද නොහැකි
වමාරන්නටද නොහැකි
මේ දුක් ගිනිගල
කාටවත්ම නොපෙනෙන්නට නගම්
මන්දස්මිතය

♦ වසන්තා කුමාරි දසනායක
මයිලවලාන කිරිඳිවැල
Sri Lanka

## දෛවයේ සරදම්

පාළම මතින් සෙලවෙන අපි පිය මැන්නා
ඒ ගං ඉවුරෙ ඔබෙ උණුසුම මට දුන්නා
හිම පිරි නුවර මා අද තනිවී ඉන්නා
නැත දිවි මිහිර ඔබගෙන් තොර මා දන්නා

සිහින ලොවෙහි අප නිති සැනසුනෙ නැතිද
පියවි ලොවෙහි අප හමු නොවුණේ මන්ද
මගෙ ආදරේ අඩුවක් හෙම දැනුණේද
හිමියනි මහැර යන්නේ හිත දුක නැද්ද

ඔබෙ සිත ළඟ දැහැනක වැද සිටියෙ මම
මගෙ හද ඔබගෙන් මුදවන්නේ කොහොම
මහ ගිනි කඳු මුදුනෙයි දැන් ඉන්නෙ මම
සුන්වී යාම වලකනු හැකි වෙද කොහොම

ඔබ වෙත සෙනේහෙන් බැඳුණේ ඇත්තට මයි
ඔබෙ සෙනෙහස හොඳහැටි මට දැනුණ තමයි
අප හමුවුණේ දෛවයෙ සරදමක් ලෙසයි
ඔබ හැරයන්නෙ මාගේ පෙර කරුමය ටයි

බඹරිඳු නොමැති කල කුසුමක් වට සරන
ඒ පුල් මල පරවයයි සෝකෙන් හඬන
බඹරිඳු නිසා රොන් කෙමි පැණියෙන් පුරණ
පෙරමග බලයි බඹරිඳු යළි වඩින දින

සිටිනා දෙසක ඔබ සතුටින් වෙරැ දේවා
කඳුළු දිවි මගේ අසලක නොරැ දේවා
ඔබ මුදු සිතෙහි මා මතකය නොසි දේවා
නිති හදඹරේ ඔබ මගෙ පුන් සඳ වේවා!

♦ මේනු පෙරේරා Ilford Essex UK

## අ (හීම්)

මිදුලෙ වතු සුදු ගහේ කුසුම් පිපිලා බෝම
මගෙ හිතත් ඒ වගේ වටහ දෙන්නේ කෝම
නුඹෙ නමට උපන් පෙම් මල් පොකුරු පිපිලාම
මගේ හද මඬල නුඹ සිහි කරයි හැමදාම

දුර ඈත අහස දෙස බලා සිටිනා රැක
නුඹේ වත පෙනේ මට පිරුණු තරුපොකුරු අග
ඒත් හඳ ආවාම ආකහේ අඳුර පිස
නුඹේ වත මට හොරා නොපෙනි යනවා ඈත

මුදු සිනා පා සැනින මගේ සිත සොරාගෙන
නුඹ ගිහින් නොදැනීම කවුරු දන්නේ කෝම
නුඹේ වත මඬල මට අහිමි වී යන දාට
හඬන්නට දෙයක් නැත නුඹේ සිත මා ගාව

ආකහේ හූරගෙන අඬන මේ මහ වැස්ස
මහ පොළව හිල්කරන් ඇද හැලෙන අපූරුව
නොදන්නෙමි නුඹ කොහිද
වැහි බින්දු තුළ සැඟව
මා දිහා බලන් ඇති නිවුණු දෑසින් යුතුව

♦ චමිලා සෝමිරත්න
පේරාදෙණිය විශ්වවිද්‍යාලය Sri lanka